විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No.: විවැ/පා/17/ නිවාඩු

ඔබේ අංකය / உமது இல. / Your No.: ..........................

දිනය / திகதி / Date: 2019/09/06

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්,
සියලුම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිවාඩු ගණනය කිරීම</u>**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිවාඩු යාවත්කාලීන කිරීම සඳහා 2019.10.01 දින සිට නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විසින් පියවර ගෙන ඇත.

02 ඒ අනුව, දැනට හඳුන්වාදී ඇති නිවාඩු කළමනාකරණ පද්ධතිය (System) හරහා 2019.10.01 දින සිට මාසිකව නිවාඩු යාවත්කාලීන කළ යුතු අතර 2019 සැප්තැම්බර් මාසයට අදාල නිවාඩු වාර්තා ද මෙම පද්ධතිය මගින් ඉදිරිපත් කල යුතුවේ. මෙහිදී මෙතෙක් පාලන අංශයට එවනු ලැබූ මාසික නිවාඩු විස්තරය ඔබගේ අධීක්ෂණ නිලධාරියා මගින් අනුමත කරගෙන නිවාඩු කළමනාකරණ පද්ධතියට උඩුගත (Upload) කිරීම කළ යුතුය.

03 ඒ අනුව 2019.10.01 දිනෙන් පසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නිවාඩු වාර්තා තැපැල් මගින් මාසිකව පාලන අංශය වෙත එවීම අවශ්‍ය නොවේ.

04 2019 වසරේ ජනවාරි මස සිට අගෝස්තු දක්වා පාලන අංශය වෙත එවනු ලැබූ මාසික නිවාඩු විස්තර පද්ධතියට ඇතුලත් කිරීම නිවාඩු විෂය ලිපිකරු විසින් සිදුකරනු ලබන අතර අසම්පූර්ණ මාස වලට අදාල දත්ත පද්ධතියට ඇතුලත් කිරීම අදාල නිලධාරියා විසින් සිදුකළ යුතුය.

05 පද්ධතියට දත්ත ඇතුළත් කිරීම පිළිබඳ පරිශීලක අත්පොත ද (User Guide) මේ සමඟ අමුණා ඇත. එහි ඇති පියවර අනුගමනය කිරීමෙන් පද්ධතිය භාවිත කිරීම පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වේ. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලන අංශය අමතන්න. (දුරකථන අංක - 011-5921659/011-2326930)

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්